# <u>හම්බන්තොට දිස්ත්‍රික් ධීවර සම්බන්ධීකරණ කමිටු රැස්වීම - 2025.06.06</u>

ධීවර, ජලජ සහ සාගර සම්පත් ගරු නියෝජ්‍ය අමාත්‍ය රත්න ගමගේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, රාජ්‍ය නිලධාරීන්ගේ හා ධීවර කාර්මිකයින්ගේ සහභාගීත්වයෙන් 2025.06.06 දින ප.ව.2.00ට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදි. පැමිණ සිටි නිලධාරීන් පැමිණීමේ ලේඛනය පරිදි වේ.

හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ පවත්වනු ලබන ප්‍රථම දිස්ත්‍රික් ධීවර සම්බන්ධීකරණ කමිටු රැස්වීමට සහභාගී වූ ධීවර, ජලජ සහ සාගර සම්පත් ගරු නියෝජ්‍ය අමාත්‍ය රත්න ගමගේ මැතිතුමා සහ දේශපාලන නායකත්වය හා සියළුම නිලධාරීන් දිස්ත්‍රික් ලේකම්තුමා විසින් පිළිගැනීමෙන් අනතුරුව ධීවරයින්ගේ ගැටළු විසඳීම සඳහා මෙවැනි රැස්වීමක් සංවිධානය කිරීමේ වැදගත්කම පැහැදිලි කරමින් රැස්වීමේ ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා ධීවර, ජලජ සහ සාගර සම්පත් ගරු නියෝජ්‍ය අමාත්‍ය රත්න ගමගේ මැතිතුමාට අවස්ථාව ලබාදෙන ලදි.

ඉන්පසු ධීවර, ජලජ සහ සාගර සම්පත් ගරු නියෝජ්‍ය අමාත්‍ය රත්න ගමගේ මැතිතුමා විසින් රැස්වීමේ අරමුණ පැහැදිලි කළ අතර, මෙහිදී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ දී ධීවර ගැටලු සම්බන්ධව වැඩි අවධානයක් යොමු නොවන හෙයින් සහ ධීවර අමාත්‍යාංශයේ කටයුතු කරගෙන යාමේ දී අනෙකුත් රාජ්‍ය ආයතනවල සහයෝගය අත්‍යාවශ්‍ය බැවින් එම සහයෝගය ලබා ගැනීමේ පහසු ඒකකයක් ලෙස මෙම කමිටු රැස්වීම පැවැත්වීමට කටයුතු සංවිධානය කළ බව ප්‍රකාශ කරන ලදි. එම කමිටුව මාස 3කට වරක් පවත්වා ප්‍රගතිය ලබා ගැනීමට සුදුසු බව සඳහන් කරන ලදි. රටේ ජාතික ආර්ථිකට වැඩි දායකත්වයක් සපයන ධීවර කර්මාන්තය නිෂ්පාදන ආර්ථිකය වැඩිදියුණු කිරීමට දායකකර ගැනීම මෙහි අපේක්ෂාව බව සඳහන් කරන ලදි. ගොඩවාය ඓතිහාසික ධිවර වරාය, මාවැල්ල, වැලිපටන්විල සහ රැකව යන නැංගුරම් තොටුපොළවල් සහ කිරින්ද, තංගල්ල, කුඩාවැල්ල, හම්බන්තොට සහ කළමැටිය යන ප්‍රධාන වරායන් 5කින් සමන්විත හම්බන්තොට දිස්ත්‍රික්කයේ ධීවර පවුල් 1000ක් පමණ සිටින බවත් ධීවර කර්මාන්තයේ පවතින ගැටලු කඩිනමින් විසඳීම සඳහා මෙම කමිටුව යොදාගන්නා ලෙසත් ඇමතිතුමා විසින් සියලුම නිළධාරීන්ගේන ඉල්ලා සිටින ලදි.

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ ලේකම්තුමන් විසින් අදහස් දක්වමින් ධීවර කර්මාන්තය වෘත්තීය මට්ටමකට ගෙන ඒමෙන් ධීවර කර්මාන්තයෙන් තරුණ ප්‍රජාව ඈත්වීම වළක්වා ගැනීමත්, රටේ ප්‍රෝටීන අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට දායකවීමට හා රටෙහි ඩොලර් අවශ්‍යතාවය සපුරා ගැනීමට ධීවර කර්මාන්තය පත්කළ යුතු බව අවධාරණය කරන ලදි. ඒ සඳහා රාජ්‍ය නිලධාරීන් දායකත්වය ලබා ගැනීම අත්‍යාවශ්‍ය බවත් දන්වන ලදි.

මින්පසු දකුණු පළාත් ධීවර අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අදහස් දැක්වීමේදී ධීවර කර්මාන්තය ආශ්‍රිත ගැටලු නිරාකරණය සහ කර්මාන්තයේ සංවර්ධනය මෙන්ම කර්මාන්තයේ නියැලෙන ප්‍රජාවගේ ජන ජීවිතය උසස් මට්ටමකට ගෙන ඒමට කටයුතු සලසන කමිටුවක් බවට ධීවර කමිටුව පත්විය යුතු බවටත් ඒ සඳහා අවශ්‍ය උපරිම සහයෝගය තම අමාත්‍යාංශය මඟින් ලබාදෙන බවත් පැහැදිලි කරන ලදි.

මින්පසු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් හා අනෙකුත් ආයතනවලින් ලබාගත් ගැටලු සාකච්ඡාවට ගත් අතර, එහිදී සාකච්ඡා වූ කරුණු පහත පරිදි වේ.

| අ.අ. | ගැටළුව | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01. | තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රැකව නැගෙනහිර නැංගුරම් තොටුපල ගල් බැම්ම ඉදි කිරිමේදි මුහුදට බෝට්ටු ඇතුල් කරන හා නැවත වරායට බෝට්ටු පැමිනෙන දොරටුව නිසි ස්ථානයේ ඉදි නොකිරිම නිසා කුඩා බෝට්ටු පෙරලිමේ අවදානමක් පවති. | ගල් බැම්ම ඉදිකිරීම නිසා තොටුපල බාදනය වීමක් සිදු වීමෙන් එහි අවදානමක් පවතින බවත් නව බැම්මක් ඉදි කිරීම සඳහා සැලසුම් හා ඇස්තමේන්තු සකස් කර තංගල්ල ධිවර වරාය කළමණාකරු වෙත යවා ඇති බවට සාකච්ජා විය. | ගල් බැම් ඉදි කල බොහෝ ස්ථාන වල වෙරළ ඛාදනය සිදු වීම ගැටලුවක් වී ඇති බැවින් ගල් බැම් ඉදිකිරීමේදි ධිවරයින් සමඟ සාකච්ජා කර රළ බිදෙන ස්ථානය අනුව සැලසුම් සකස් කිරීමට ධීවර වරාය නිතිගත සංස්ථාව වෙත උපදෙස් ලබා දෙන ලදි. | සභාපති, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව<br><br>තංගල්ල වරාය කළමණාකරු |

[illegible] ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner

| | | | | |
|---|---|---|---|---|
| 02. | පල්ලික්කුඩාව ග්‍රාමයේ රාත්‍රි කාලයේ පොකිරිස්සන් ඇල්ලීම සඳහා මුහුදට බසින ධීවරයින් බිත්තර සහිත පොකිරිස්සන් ඇල්ලීම නිසා පොකිරිස්සන් වඳ වී යාම | පෙබරවාරි, සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් යන කාලවලදී පොකිරිස්සන් ඇල්ලීම තහනම් කර තිබියදී ත් ධීවරයින් එම ක්‍රියාවේ යෙදෙන බවට කරුණු ඉදිරිපත් විය. | මත්ස්‍ය සම්පත රැකගැනීම අපගේ යුතුකමක් බව ධීවර ප්‍රජාව දැනුවත් කළ යුතු බවත්, නාවික හමුදාවට සහ පොලීසියට අදාළ නීතිය ක්‍රියාත්මක කරන ලෙසත් උපදෙස් දෙන ලදි. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී<br><br>නාවික හමුදාව, තංගල්ල<br><br>වරාය කළමණාකරුවන් කිරින්ද, තංගල්ල, කුඩාවැල්ල, හම්බන්තොට සහ කළමැටිය |
| 03. | ජුල්ගහ වැල්ල වෙරළ ඛාදනයට දැමූ ගල් බැම්ම නුසුදුසු බැවින් එය ඉවත් කිරීමට කටයුතු කිරීම | 2015-2019 කාලයේදී ධීවර සංස්ථාව විසින් ඉදිකරන ලද්දක් බවත්, මේ නිසා වෙරළ ඛාදනයක් සිදු වී ඇති බවටත් කරුණු ඉදිරිපත් විය. | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මෙම ගැටළුව පිළිබඳ සොයා බලා වාර්තාවක් ලබා දෙන ලෙස උපදෙස් ලබා දෙන ලදි | සහකාර අධ්‍යක්ෂ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 04 | ජුල්ගහවැල්ල නුගේ වැල්ලේ තිබූ සූර්ය පැනල දෙක ඉවත් කිරීම | මුහුදු ඛාදනය හේතුවෙන් ගැලවී ඇති බව සාකච්ඡා විය. | එහි සූර්යය පැනල දෙක නැවත සවිකිරීමට තීරණය විය. | දකුණු පළාත් ධීවර අමාත්‍යාංශයේ ලේකම් |
| 05 | ධීවර කර්මාන්තයේ නියැලෙන්නන්ගේ දැනුම් මට්ටම අවම මට්ටමක පැවතීම | නවීන තාක්ෂණික දැනුම ධීවර කාර්මිකයින්ට ලබාදීම අත්‍යාවශ්‍ය බව සඳහන් කළ අතර, දැනටමත් ධීවර කාර්මිකයින් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක වන බවත් ස්ක්‍රිපර් බලපත්‍ර හා ජීවිතාරක්ෂක කබා ධීවර කාර්මිකයින්ට ලබා දී ඇති බවත් සඳහන් විය. | අවශ්‍ය සහයෝගය ලබා දීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදි. | සහකාර අධ්‍යක්ෂ, ධීවර කාර්යාලය, තංගල්ල |
| 06 | සාලයන් ඇල්ලීමට යොදා ගනු ලබන ලයිට් කෝස් දැල් තහනම් කිරීම. | ලයිට් කෝස් දැල දැනට භාවිතා නොකරන බවට ධීවරයින් ප්‍රකාශ කරන ලදි. | දකුණු පළාත් ධීවර අමාත්‍යාංශයේ නිලධාරීන් සහ ධීවර කාර්මිකයින් විසින් දැනට ලයිට් කෝස් දැල සාලයින් ඇල්ලීම සඳහා යොදා නොගන්නා බව සඳහන් කරන ලදි. | සහකාර අධ්‍යක්ෂ, ධීවර කාර්යාලය, තංගල්ල |
| 07 | කුඩාවැල්ල ප්‍රදේශයේ උම්බලකඩ නිෂ්පාදනයේදී මාළු තම්බන වතුර නිසි පරිදි බැහැර කිරීමට ක්‍රමවේදයක් නොමැති වීම. | නිසි ක්‍රමවේදයකින් තොරව උම්බලකඩ හා සැමන් නිෂ්පාදනයට යොදා ගන්නා මත්ස්‍යයන් සේදූ ජලය බැහැර කිරීම නිසා එම ප්‍රදේශයේ දුර්ගන්ධයක් හමන බවට අදහස් ඉදිරිපත් විය. එහෙත් මධ්‍යම පරිසර අධිකාරිය වෙත මේ දක්වා පැමිණිල්ලක් ලැබී නොමැති බවද සාකච්ඡා විය. කාර්මාන්තයට හා මහජනතාවට හානියක් නොවන පරිදි ක්‍රමවේදයක් සැකසිය යුතු බවට සාකච්ඡා විය. | අදාළ සියළුම පාර්ශ්ව සම්බන්ධ කර ගනිමින් මෙම කර්මාන්තය ඉදිරියට කරගෙන යාමට බාධාවක් නොවන පරිද්දෙන් ගැටළුව විසඳීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කර දෙන ලෙස උපදෙස් ලබා දෙන ලදි. | ප්‍රාදේශීය ලේකම් තංගල්ල<br><br>සහකාර අධ්‍යක්ෂ මධ්‍යම පරිසර අධිකාරිය<br><br>සහකාර අධ්‍යක්ෂ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය<br><br>නාරා ආයතනය<br><br>වරාය කළමණාකරු කුඩාවැල්ල |

(අත්සන)
ඩබ්ලිව්. එච්. කරුණාරත්න / ...
ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner

| | | | | |
|---|---|---|---|---|
| 08 | රාත්‍රී කාලයේ උණාකුරුව බටහිර වසමේ සහ මාවැල්ල ධීවර කාර්මිකයින්ට ඔරු තොටුපළ හඳුනාගත නොහැකි වීම | උණාකුරුව බටහිර හා මාවැල්ල තොටුපලෙහි විදුලි සංඥා පහන් අක්‍රිය වීම නිසා රාත්‍රී කාලයේ දී ධීවරයින්ට තොටුපල හඳුනාගැනීමේ අපහසුතාවක් පවතින බව කරුණු ඉදිරිපත්විය. | ධීවර තොටුපලවල විදුලි සංඥා පහන් ස්ථාපිත කිරීමට කටයුතු කර ඇත. | දකුනු පළාත් ධීවර අමාත්‍යාංශයේ ලේකම්<br><br>සහකාර අධ්‍යක්ෂ, ධීවර කාර්යාලය, තංගල්ල<br><br>උණාකුරුව හා මාවැල්ල ධීවර පරීක්ෂක |
| 09. | උණාකුරුව ධීවර මධ්‍යස්ථානය සහ ඔරු තොටුපළ ඉදිරිපිට වෙරළ ඛාදනය වීම | සංචාරක කර්මාන්තයේ යෙදෙන ව්‍යාපාරිකයෙකු විසින් උණාකුරුව වෙරළේ දකුණු පැත්තේ ඉදිකර ඇති ගල් බැම්ම නිසා වෙරළ ඛාදනයක් සිදු වන බවත්, මේ නිසා ප්‍රදේශයේ ධීවර කර්මාන්තකරුවන් අවධානමකට ලක්ව ඇති බවත් කරුණු ඉදිරිපත් විය. | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ඉංජිනේරු සමඟ සාකච්ඡා කොට මෙම ඛාදනය වැළකීම සඳහා ගත යුතු පියවරයන් පිළිබඳ වාර්තාවක් ලබාදෙන ලෙස වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට උපදෙස් ලබා දෙන ලදි. | සහකාර අධ්‍යක්ෂ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ |
| 10. | උණාකුරුව වෙරළේ විශාල ලෙස ප්ලාස්ටික් පොලිතින් අපද්‍රව්‍ය ඒකරාශි වීම | ධීවර කාර්මිකයින් සහ වෙරළට පැමිණෙන සංචාරකයින් විසින් රැගෙන යන පොලිතීන් ඇතුළු ප්ලාස්ටික් අපද්‍රව්‍ය හේතුවෙන් වෙරළට ප්ලාස්ටික් අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් එකතු වන බව සාකච්ඡා විය.<br><br>තව ද ධීවර කාර්මිකයින් විසින් ජලය රැගෙන යාම සඳහා ලී.1 හා ලී.1.5 ප්‍රමාණයේ ප්ලාස්ටික් බෝතල් රැගෙන යාමෙන් මෙම ගැටලුව තවත් වැඩි වී ඇති බවටත් කරුණු ඉදිරිපත් විය.<br><br>එහෙත් ධීවර වරාය නීතිගත සංස්ථාව මඟින් ජලය ගෙන යාම සඳහා ලී.5 හෝ ඊට ඉහළ ප්‍රමාණයේ කෑන් භාවිතා කිරීම සඳහා ධීවරයින්ට උපදෙස් ලබා දී ඇති බවත්, ඒවා නිසි අධීක්ෂණයට ලක් විය යුතු බවත් පැහැදිලි කරන ලදි. | වෙරළේ බඳුන් ස්ථාපිත කිරීමේ හැකියාව පිළිබඳව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් හා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියෙන් විමසීම් කිරීමටත්, අපද්‍රව්‍ය වෙන් කර බැහැරකිරීම සම්බන්ධයෙන් ධීවරයින් දැනුවත් කිරීමටත් තීරණය වූ අතර, ධීවරයින් මුහුදු යන විට රැගෙන යන බඩු නිරීක්ෂණය කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කරන ලෙසට වරාය කළමණාකරු වෙත උපදෙස් ලබා දුනි.<br><br>වරාය වෙත එකතුවන ප්ලාස්ටික් අපද්‍රව්‍ය සතියකට වරක් ප්‍රාදේශීය සභාවෙන් එකතු කිරීමේ ක්‍රමවේදයක් සකස් කරන ලෙස දන්වන ලදි. | සහකාර අධ්‍යක්ෂ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය<br><br>සහකාර අධ්‍යක්ෂ, ධීවර කාර්යාලය, තංගල්ල<br><br>වරාය කළමණාකරුවන් කිරින්ද, තංගල්ල, කුඩාවැල්ල, කළමැටිය, හම්බන්තොට |
| 11. | උණාකුරුව නැගෙනහිර වසමේ කොරිය වැව ආර්ථිකමය ලෙස ඵලදායි කාර්යයක් සඳහා යොදා නොගැනීම | කොරියවැව ගල් වලක් බවත්, ගල්වලවල මත්ස්‍යයින් තැන්පත්කිරීම සිදුනොකරන බවත් කරුණු සාකච්ඡා විය. | කොරියවැවෙහි මත්ස්‍ය ඇඟිල්ලන් හා ඇසිත්තන් තැන්පත් කිරීමේ හැකියාව පිළිබඳ සොයා බලා වාර්තාවක් ලබා දෙන ලෙස ජලජීවී ව්‍යාප්ති නිලධාරී වෙත උපදෙස් ලබා දෙන ලදි. | දිස්ත්‍රික් ජලජීවී ව්‍යාප්ති නිලධාරී |
| 12. | වැල්ලෝඩය මා දැල් තොටුපල තිබෙන ස්ථානය අඳුරේ පැවතීම | වැල්ලෝඩය ධීවර වරාය තිබෙන ස්ථානය අඳුරු ස්වභාවයක් ගැනීම නිසා ගැටළු රැසක් මතු වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | වැල්ලෝඩය ධීවර වරාය භූමියෙහි පහන් සවිකිරීමට උපදෙස් දෙන ලදි. | සභාපති තංගල්ල ප්‍රාදේශීය සභාව |

[illegible] ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner

| | | | | |
|---|---|---|---|---|
| 13. | වැල්ලෝඩය මාදැල් වරායට පිවිසෙන මාර්ගය ඉතා පටු බැවින් වරායට යාම සඳහා ධීවරයින්ට අපහසු තත්වයක් ඇති වීම | මාර්ගය පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී තීරණය කළ බවට කරුණු ඉදිරිපත් වූ අතර, ධීවර අමාත්‍යාංශය හරහා ඉඩම් අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති බවටත් කරුණු ඉදිරිපත් විය. | මාර්ගය පුළුල් කිරීමේ කටයුතු කඩිනමින් සිදුකරන ලෙසට උපදෙස් ලබා දුනි.<br><br>තව ද මාර්ගය පුළුල් කිරීම සඳහා ඉඩම් අමාත්‍යාංශය වෙත යවන ලද ලිපියේ පිටපතක් ධීවර අමාත්‍යාංශයේ ලේකම් වෙත ලබා දෙන ලෙස දන්වන ලදි. | ප්‍රාදේශීය ලේකම් තංගල්ල<br><br>වරාය කළමණාකරු තංගල්ල |
| 14. | වැල්ලෝඩය බයිසිකල් මගින් මාළු වෙළඳාම යන අයට වෙළඳාම් කටයුතු කරගෙන යාම අපහසු තත්වයක් පැවතිම බාස්කට් වල මාළු රැගෙන යාම අපහසු වීම. | මාළු වෙළඳාම් කරන පුද්ගලයින් සඳහා මාළු පෙට්ටි ලබා දීම සුදුසු බවට කරුණු ඉදිරිපත් විය. | මාළු පෙට්ටි ලබා දීමේ වැඩසටහනක් මෙම වසරේ පළාත් සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන බවත්, මාළු පෙට්ටි ලබා දීමට අවශ්‍ය ප්‍රතිලාභීන්ගේ ලේඛනයක් සකස් කොට දකුණු පළාත් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දෙන ලදි. | ලේකම්, දකුණු පළාත් ධීවර අමාත්‍යාංශය<br><br>සහකාර අධ්‍යක්ෂ, ධීවර කාර්යාලය, තංගල්ල<br><br>ධීවර පරීක්ෂක, තංගල්ල |
| 15. | පරප්පුව වැව සංචාරක හා ධීවර කර්මාන්තය සඳහා ප්‍රතිසංස්කරණය කිරීම | පරප්පුව වැව සංචාරක හා ධීවර කර්මාන්තය සඳහා ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට කරුණු ඉදිරිපත් විය. | මෙම කටයුත්ත 'වාරි උදානය' වැඩසටහන යටතේ සිදුකළ හැකි දැයි ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වෙතින් මේ පිළිබඳ කරුණු විමසන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් තංගල්ල |
| 16. | බඳගිරිය වැව, මහගල් වැව ඇතුළු බහුතරයක් ජලාශවල කුඩා කටු මගින් බිලී බෑම නිසා කුඩා මසුන් විශාල ලෙස ජලාශයෙන් ඉවත්වීම | කුඩා කටු මගින් බිලී බෑම ධීවර පනතින් නිදහස් කර ඇති බවත් එම නිසා නීතිය ක්‍රියාත්මක කළ නොහැකි බවටත් විශාල ප්‍රමාණවලින් මාළු බිලී බෑම සිදුවීම ගැටළු සහගත බවටත් කරුණු ඉදිරිපත් විය. | කුඩා කටු මගින් බිලී බෑම නතර කරන නීති කෙටුම්පත් කිරීම සහ එක් පුද්ගලයකු සඳහා දිනකට බිලී බා ගත හැකි මත්ස්‍ය කිලෝ ප්‍රමාණයක් නීතිගත කිරීම ඇතුළත් නීති කෙටුම්පත් සකස් කරමින් පවතින බැවින් ඉන්පසු තීරණයක් ගැනීම සුදුසු බවට තීරණය විය. | ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට<br><br>දිස්ත්‍රික් ජලජීවී ව්‍යාප්ති නිලධාරී |
| 17. | මීගහජඳුර වැව, කැලිගම වැව, කපුවත්ත වැව, පන්වැව, සමරකෝන් වැව, කටු වැව, උඩුකිරිවිල වැව සූරියවැව-ගල්වැව ජලජ ශාක බහුල වීම නිසා ධීවර කටයුතු සිදු කිරීමට අපහසු වීම හා එම ශාක හේතුවෙන් දැල් | ජලජ ශාක ඉවත් කිරීම සඳහා මෙම වැව්වලට මැෂින් දැමීම කළ නොහැකි බවටත්, මීගහජඳුර, තැලවිල්ල ජලාශවල ධීවර කටයුතු මේ වන විට නැවතී ඇති බවටත් කරුණු ඉදිරිපත් විය. | ජලජ ශාක ඉවත් කිරීමට ඇස්තමේන්තුවක් සකස් කර වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලෙස දිස්ත්‍රික් ජලජීවී ව්‍යාප්ති නිලධාරී වෙත උපදෙස් ලබා දෙන ලදි.<br><br>මසක් ඇතුළත මෙම ඇස්තමේන්තුව සකස් කරන ලෙස උපදෙස් ලබා දෙන ලදි. | වාරිමාර්ග අධ්‍යක්ෂ<br><br>පළාත් වාරිමාර්ග ඉංජිනේරු,<br><br>නේවාසික ව්‍යාපෘති කළමණාකරු<br><br>දිස්ත්‍රික්පල ජලජීවී ව්‍යාප්ති නිලධාරී, |

ඉන්දුවිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner

| | | | | |
|---|---|---|---|---|
| | ආම්පන්න විනාශ වීම | මාස් හෝල්ඩින්ස් ආයතනයෙන් නොමිලයේ වැව්වල ජලජ ශාක ඉවත් කර ඒවා වස්ත්‍ර සිලෝන් ආයතනයට දෙන බවටත් කරුණු ඉදිරිපත් විය. | ජපන් ජබර ලබාගැනීම සඳහා වස්ත්‍ර සිලෝන් ආයතනය සම්බන්ධීකරණය කරන ලෙස දන්වන ලදි. | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 18. | ස්වභාවික ව්‍යසනවලදී හානි ප්‍රතිපූර්ණය සඳහා ක්‍රමවේදයක් නොමැතිවීම. | ස්වභාවික අපදා, වන අලි ආපදා වැනි විශේෂ ව්‍යසනවලදී ධීවර යාත්‍රා ආම්පන්න හා ජලජීවී වගාවන්ට සිදුවන ආපදා සම්බන්ධව දැනුම්දීම සඳහා ක්‍රමවේදයක් නොමැති වීම හා එම හානි ප්‍රතිපූර්ණය සඳහා වැඩපිළිවෙලක් නොමැති බවත්, මේ සඳහා රක්ෂණ ක්‍රමයක් නොමැති වීම පිළිබඳවත් සාකච්ඡා කරන ලදි. | රක්ෂණ සමාගම් සමග ජාතික වශයෙන් සාකච්ඡා කිරීමට කරුණු ඉදිරිපත් විය | ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ ලේකම්. |
| 19. | ධිවර පවුල් වල සනීපාරක්ෂක පහසුකම් දූර්වල වීම | ධීවර කර්මාන්තයේ යෙදෙන පවුල්වල සාමාජිකයින් සඳහා ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් නොමැතිවීම ප්‍රධාන ගැටලුවක් බවට කරුණු ඉදිරිපත් විය. එමෙන්ම නිවාස අමාත්‍යාංශයෙන් හා සමාජ සේවා ආමාත්‍යාංශයෙන් සනීපාරක්ෂක කටයුතු සඳහා ප්‍රතිපාදන ලබා දෙනුයේ සීමිත සංඛ්‍යාවකට බවට කරුණු ඉදිරිපත් විය. | සනීපාරක්ෂක පහසුකම් නොමැති ධිවර පවුල් පිළිබඳ තොරතුරු ලබා ගන්නා ලෙසත්, මෙම ගැටලුව අධියරෙන් අධියර විසඳීම සඳහා තීරණය විය | දිස්ත්‍රික් ජලජීවී ව්‍යාප්ති නිලධාරි, |
| 20. | ලුණුගම්වෙහෙර ජලාශයේ ධිවර කටයුතු අකර්මන්‍ය වීම.<br>රජයේ නීතිරීති සමඟ ධීවර ජනතාව කටයුතු කිරීමට මැලි වීම හා ධිවර සංවිධාන සහයෝගය නොමැති වීම හේතුවෙන් නිළධාරීන්ට රාජකාරී කිරීමේ අපහසුතාවයක් පැවතීම | වැවැක් සමග ගමක් යටතේ ඉදි කරන ලද ධීවර විවේකාගාරය දැනට ධීවරයින් විසින් භාවිතා නොකරන බවටත් එම නිසා එම ගොඩනැග්ලිල වනජීවී බිට්වූ කාර්යාලයක් ස්ථාපිත කිරීම සුදුසු බවටත් කරුණු ඉදිරිපත් විය. | එම ගොඩනැගිල්ල වනජීවී දෙපාර්තමේන්තුවට ලබා දීම සඳහා ධීවර අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමට තීරණය විය. | ධිවර,ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ ලේකම් |
| 21 | විසිතුරු මත්ස්‍ය වගාව සඳහා අවශ්‍ය උපාංග සහ ඖෂධ ලබා ගැනීමේදී එම ද්‍රව්‍ය වල හිඟතාවය | විසිතුරු මත්ස්‍යයින්හට ප්‍රතිජීවක ඖෂධ භාවිතා කර අප ජලය පරිසරයට මුදා හැරීම ගැටලු සහගත බවත්, නගුවාන් ඖෂධය තහනම් | ජලය පිරිපහදු කර භාවිතා කිරීමට සුදුසු බවට තීරණය විය.<br><br>තව ද මේ පිළිබඳව | ලේකම් ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය |

විමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner

| | | | | |
|---|---|---|---|---|
| | සහ යම් යම් ඖෂධ ආනයනයට ඇති තහනම. | කර ඇති බැවින් මෙම ගැටලුව උග්‍ර වී ඇති බවත් සඳහන් විය. තව ද මත්ස්‍ය වගාකරුවන් සඳහා කොන්ඩිස් ලබා ගැනීමට අපහසු වී ඇති බව ද සඳහන් විය. | සැලකිල්ලට ගෙන සුදුසු පියවරක් ගැනීමට නියෝජ්‍ය ඇමතිතුමා එකඟ විය. | දිස්ත්‍රික් ජලජීවී ව්‍යාප්ති නිලධාරී, |
| 22. | විසිතුරු මත්ස්‍ය කර්මාන්තය මුහුණ දෙන ගැටලු | සියලුම විසිතුරු මත්ස්‍ය ගොවිපලවල් හා අලෙවිසැල් ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය යටතේ නිරන්තර පරීක්ෂාවට ලක්නොවීම, සියලුම මත්ස්‍ය ගොවිපලවල් ප්‍රමිතිකරණයට ලක් කිරීම, නිරෝගී මව්සතුන් ලබා ගැනීමට දිස්ත්‍රික්කය තුල ක්‍රමවේදයක් නොමැතිවීම, නිරෝධායනයට අවශ්‍ය ඖෂධ ලබා ගැනීමට ක්‍රමවේදයක් සැලසීම, නිෂ්පාදන අලෙවි කරගැනීම සඳහා දිස්ත්‍රික්කය තුල අලෙවි මධ්‍යස්ථානයක් නොමැති බවට කරුණු ඉදිරිපත් විය. මේ සඳහා ක්‍රියාකිරි සැලැස්මක් සකස් කිරීම සුදුසු බවට කරුණු ඉදිරිපත් විය. | ක්‍රියාකිරි සැලැස්මක් සකස් කර ධීවර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දෙන ලදි. | දිස්ත්‍රික් ජලජීවී ව්‍යාප්ති නිලධාරී, |
| 23. | ජලජීවී වගාකරුවන් සඳහා බලපත්‍ර ලබා ගැනීම | ජලජීවී වගාකරුවන්ට බලපත්‍ර ලබාගැනීමේ දී වසරක් පාසා එකම ලියවිලි ලබා දීමට සිදුවන බැවින් එය පහසුකර දෙන ලෙස ඉල්ලීම් කරන ලදි. | ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සැලසීම සඳහා සැලකිල්ලට ගන්නා බව නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කරන ලදි. | ලේකම්, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය |
| 24. | කිරින්ද වරායේ ගොඩගැසී ඇති වැලිකන්ද පිළිබඳ ගැටලුව | වැලි කියුබ 28000 පමණ ගොඩ ගැසී ඇති බවත් සියලුම වැලි මුහුදට පොම්ප කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇති බවත් කරුණු ඉදිරිපත් විය. | කඩිනමින් මෙම කාර්යය සිදුකරන ලෙස උපදෙස් ලබා දෙන ලදි. | ලේකම්, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය<br>කළමණාකරු, ශ්‍රී ලංකා වරාය නීතිගත සංස්ථාව |
| 25. | කිරින්ද වරාය රේඩියෝ කාමරයේ රේඩියෝව අක්‍රියව පැවතීම. | රේඩියෝව අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය උපාංග ජපානයෙන් ආනයනය කර ඇති බව කරුණු ඉදිරිපත් විය. | සති 02 ක් ඇතුලත අලුත්වැඩියා කර භාර දීමට තීරණය විය. | කිරින්ද වරාය කළමණාකරු. |
| 26. | කිරින්ද වරායේ සංඥා පහන් අක්‍රියව පැවතීම | වරාය පිවිසුම් දොරටුවේ සංඥා පහන් අක්‍රිය බවත් , එය සක්‍රිය තත්වයේ පැවතීම නිසාවෙන් වෙනත් වරායන්ට අයත් යාත්‍රා පැමිණෙන්නේ නම් ගල් පරයේ වැදී අනතුරට ලක්විය හැකි බැවින් එය ගැටලුවක් බවත් කරුණු ඉදිරිපත් විය. පිටතින් පැමිණෙන යාත්‍රා දැනුවත් කිරීම හා එසේ අනතුරකට | ධීවරයින්ගේ බලවත් ඉල්ලීම හේතුවෙන් සංඥා පහන් ස්ථාපනය කිරීමට තීරණය විය. | කිරින්ද වරාය කළමණාකරු. |

ඩිලජ් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner

| | | | | |
|---|---|---|---|---|
| | | ලක්වුවහොත් එහි වගකීම ධීවරයින් ගතයුතු බවටත් කරුණු ඉදිරිපත් විය. | | |
| 27. | කිරින්ද ගොඩේ කළපුව මසුන් ඇල්ලීම තහනම් කිරීම | ඌව වන ජීවී කලාපයට අයත් කාරණයක් බවට සාකච්ඡා විය. | වන ජීවී දෙපාර්තමේන්තුවෙන් තොරතුරු දැන්වීමට උපදෙස් ලබා දුනි. | සහකාර අධ්‍යක්ෂ වන ජීවී(ඌව) |
| 28. | පල්ලෙමලල මලල කලපුව හා ඇඹිලිකළ කලපුව වැසි ජලයෙන් පිරෙන විට උඩමලල යාය යටවන බැවින් මෝය කට කැපීම. | මෝය කට කැපීම හේතුවෙන් කලපුවේ මාළුන් මුහුදට ගසාගෙන යන බවත් ඒ සඳහා පිට ඇල කැපීම සුදුසු බවටත් කරුණු ඉදිරිපත් විය. | මේ පිළිබඳ වාර්තාවක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට |
| 29. | තිස්ස වැවේ එංජින් බෝට්ටු භාවිතය. | එංජින් බෝට්ටු භාවිතය නිසා ධීවර කටයුතු සඳහා බාධා පැමිණ ඇති බවට කරුණු ඉදිරිපත් විය | ධීවර සමිති වෙතින් ලිඛිත ඉල්ලීමක් සිදු කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් තිස්සමහාරාම |
| 30. | මාවැල්ල නැංගුරම්තොටෙහි මතුවී ඇති ගැටලු | මාවැල්ල නැංගුරම් තොටෙහි ගල්බැම්ම දැමීම නිසා වෙරළ ඛාදනය සිදුවන බවට කරුණු සාකච්ඡා විය. | මෙය විසඳීම සඳහා සියළු පාර්ශ්වයන් සමඟ සාකච්ඡාකර නැංගුරම්පොළ පිහිටි ස්ථානය වෙත ගොස් විසඳුමක් ලබාගැනීම සඳහා රැස්වීමක් 2025.06.17 දින පෙ.ව.10.00ට පැවැත්වීමට තීරණය විය. | ලේකම්, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය<br>ප්‍රාදේශීය ලේකම් තංගල්ල<br>සහකාර අධ්‍යක්ෂ, ධීවර කාර්යාලය, තංගල්ල |
| 31. | තිස්සමහාරාම ප්‍රදේශයේ (යාල හන්දියේ) පිහිටි බෝට්ටු අංගනය එක් ව්‍යාපාරිකයෙකු විසින් පවත්වා ගෙන යාම | තිස්සමහාරාම ප්‍රදේශයේ (යාල හන්දියේ) පිහිටි බෝට්ටු අංගනය එක් ව්‍යාපාරිකයෙකු විසින් පවත්වා ගෙන යන බවට කරුණු ඉදිරිපත් විය. | ඒ පිළිබඳ සොයා බලා වාර්තාවක් ලබා දෙන ලෙස දන්වන ලදී. | ප්‍රාදේශීය ලේකම් තිස්සමහාරාම |

ඉන්පසුව ධීවර විශ්‍රාම වැටුප හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රමය දැනට ක්‍රියාත්මක නොවන බවත් නව ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමයක් කෘෂි රක්ෂණ මණ්ඩලය හරහා හඳුන්වා දීමට අවශ්‍ය රෙගුලාසි සකස් කර අවසන් බවත්, ධීවරයින්ගේ හැකියාව මත මාසිකව හෝ ත්‍රෛමාසිකව වාරික මුදල් තැම්පත් කර අවුරුදු 60 දී විශ්‍රාම වැටුපක් ලබන ලෙස විශ්‍රාම වැටුප් ක්‍රමය සකස් කර ඇති බවත් ධීවර අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පවසන ලදී.

ඉදිරියේදි න්‍යාය පත්‍රයක් සකස් කරන බවත්, ඒ සඳහා යෝජනා ඉදිරිපත් කරන ලෙසත්, මාස 03 කින් ඊළඟ කමිටු රැස්වීම පවත්වන බවත් දැනුම් දුන් අතර, මෙම රැස්වීම සාර්ථකව සංවිධානය කිරීම පිළිබඳව දිස්ත්‍රික් ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයටත් රැස්ව සිටි සියලු දෙනාටත් ස්තූති කරමින් ප.ව. 5.40 පමණ රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති හම්බන්තොට

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

2025 ජූනි මස .12.. දින

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

CamScanner